# 23. සමගි වෙමු

එක අත්තක ගෙඩි වගේ
එකට හැදෙන්නේ
එක පොකුරක මල් වගේ
සුවඳ හමන්නේ
එක මාලෙක මුතු වගේ
එකට රැදෙන්නේ
එක අම්මගේ දරුවො වගේ
අකුරු කරන්නේ

එක රැනක කුරුල්ලෝ
අපි එකට ලගින්නේ
එක රැල්ලක දිය බිඳු
අපි එකට ඇදෙන්නේ
එකට ඉන්නේ, එකට කන්නේ
සිංදු කියන්නේ
එක පන්තියෙ එක ම ළමුන්
අපි දෙවිඳුන්ගේ

## පැවරුම්

1. සමගි වීම වැදගත් වන්නේ ඇයි?
2. සැම කෙනෙක් ම එක සමාන බව අපට කියා දෙන්නේ කවුද?
3. ''සමගිය බලය වේ'' මෙය පොතේ ලියන්න.